**මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - 2018**

**--------------------------------------------**

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138-සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

සංවර්ධන ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක තිරසාර බෙදාහැරීම මඟින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මුල් සංවර්ධන ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය විගැහි මිලියන 69.10 (එජඩො මිලියන 100) කට සමාන රු.මිලියන 10,125 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යණය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද, විගැහි මිලියන 59.60 (එජඩො මිලියන 98.1) කට සමාන රු.මිලියන 11,579 ක අතිරේක වෙන් කිරීමක් 2008 ජුනි 23 දින එළඹි පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ සපයා තිබුණි. 2011 මාර්තු 15 දින දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුම එළඹි අතර විහැගි මිලියන 63.6 (එජඩො මිලියන 100) කට සමාන රු.මිලියන 11,081 ක අතිරේක වෙන්කිරීමක් එමගින් කර තිබුණි. ආරම්භයේදී ව්‍යාපෘතිය එහි කටයුතු 2006 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2011 මාර්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ මෙහෙයුම් අඛණ්ඩව සිදුකර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද ජාතික සහ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ නැව ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද ගාල්ල-දෙණියාය මාර්ගය සහ ඉංගිරිය-රත්නපුර මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු මත කරන ලද හිමිකම් ඉල්ලීම් පියවීම පිළිබඳ ගැටළුව 2018 දෙසැම්බර් 31 දිනවන විටත් නිරාකරණය නොවී පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් අවසන් කිරීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන විසින් අවශ්‍ය උපදෙස් ලබාදී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආරවුල් විනිශ්චය මණ්ඩල වෙත යොමුකරන ලද ගැටළුව නිරාකරණය කිරීමේ වගකීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීම සැලකිමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුචිත ලෙස යොදා ගැනීම. | ප්‍රතිචාර දක්වා නොමැත. | ව්‍යාපෘති නියාමන ඒකකයේ මෙහෙයුම් අවසන් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් පළාත් 08 ක ජාතික මාර්ගවල කිලෝමීටර් 620 ක් සහ පළාත් සභා 03 ක සහ ප්‍රාදේශීය සභා 09 ක් යටතේ පවතින පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර් 635 ක් පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, 2015 ජුනි 30 දිනට ජාතික මාර්ගවල කිලෝමීටර් 685 ක් සහ පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර 162 ක පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | දින දීර්ඝ කිරීම සහ ව්‍යාපෘතිය දීර්ඝ කිරීම මත ඇතිවන පිරිවැය, කඩිනම් කිරීම සහ අනෙකුත් අරමුණු සඳහා ඉංගිරිය - රත්නපුර මාර්ගයේ පුනරුත්ථාපන කටයුතුවලට සම්බන්ධ | අමතරව පිරිවැය දැරීමට හැකියාව | බේරුම්කරණ පටිපාටිය ආරම්භ කර වර්ෂ 9 කට පසු කොන්ත්‍රාත්කරුට පක්ෂපාතිව 2018 | රටට අවම පිරිවැයක් සහිතව ආරවුල විසඳීමට ඇති හැකියාව |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරු විසින් එකතුව රු.මිලියන 733.87 ක් හිමිකම් ඉල්ලා තිබුණු බව නිරීක්ෂණය විය. ඊට අමතරව කොන්ත්‍රාත්කරු විසින් පොළී පිරිවැය සඳහා එකතුව රු.මිලියන 841.98 ක හිමිකම් ඉල්ලා තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව 2019 ඔක්තෝබර් 10 දින පැවති රැස්වීමේදී අදාළ කොන්ත්‍රාත්කරුට එකතුව රු.මිලියන 1,000 ගෙවා හිමිකම් නිරාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. | පවතී. | පෙබරවාරි මුදලක් ලබාදීම පිළිබඳව තීරණය ගෙන තිබුණු අතර නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | සොයා බැලිය යුතුය. කොන්ත්‍රාත්කරු විසින් අමතර හිමිකම්පෑමට හේතු සොයා බැලීමට පියවර යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරුට එකතුව රු.මිලියන 67.69 ක් සහ එ.ජ.ඩො 858,017 ක් ගෙවීමට ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය සමඟ මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ නොවීම හේතුවෙන් ගාල්ල - දෙනියාය මාර්ගයේ පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම මත ගෙවීම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් මතභේදයක් පැන නැගී තිබුණු බව නිරීක්ෂණය විය. මතභේදය සාමකාමී බේරුම්කරණ කමිටුව වෙත යොමු කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරාකරණය කර නොතිබුණි. | -එම- | සාමකාමී බේරුම්කරණ කමිටුව ඔවුන්ගේ වාර්තාව මහා මාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණු අතර මෙම ගෙවීම සිදුකිරීමට කැබිනට් අනුමැතිය ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | අලාභය අවම කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2013 කටයුතු අවසන් කරන ලද කන්තලේ-ත්‍රිකුණාමල මාර්ගයේ නැවත ඉදිකිරීම් කටයුතු හේතුවෙන් නිවාස සහ ගොඩනැගිලිවලට සිදුවූ අලාභ මත පුද්ගලයින් 87 දෙනෙකුට රු.මිලියන 23 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ප්‍රමාණ පත්වල ගෙවී අයිතම් අංක 119(2) යටතේ රු.මිලියන 5 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණු අතර මාර්ග දෙපස දේපළවලට සිදුවන අලාභ මත පිරිවැය දැරීමට රක්ෂණාවරණය ලබාගැනීම සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. අලාභ මත වන්දි ගෙවීමේ වගකීම කොන්ත්‍රාත්කරු සතු වන බව එය සාක්ෂි වේ. | අධිකාරිය නොමැති ගෙවීම් කිරීමේ හැකියාව පවතී. | මාර්ගයේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ගොඩනැගිලි කඩතොළුවී ඇති බව දක්වමින් මාර්ගය දෙපස පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි සහ නිවාස අයිතිකරුවන්ගෙන් පැමිණිලි 88 ක් නැවත ඉදිකිරීම් කාලපරිච්ඡේදය අවසානයේදී සහ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා වගකියන කාලය තුළදී ව්‍යාපෘතියට ලැබී තිබුණි. විමර්ශනයක් සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් ඉල්ලීමක් කර තිබුණු අතර ඒ පිළිබඳ අවසන් වාර්තාව නිර්දේශ සමඟ 2014 අප්‍රේල් 17 දින ඉදිරිපත් කර තිබුණි. | නිවාස සහ ගොඩනැගිලිවල අලාභ කොන්ත්‍රාත්කරුගේ පිරිවැයෙන් අඩුපාඩු නිවැරදි කිරීමේ කාලපරිච්ඡේදය තුළදී නිවැරදි කිරීමට අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මාර්ග 11 පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු වර්ෂයක ප්‍රමාදයක් සහිතව නිමකර තිබුණු අතර අනෙකුත් මාර්ග 5 ක පුනරුත්ථාපන කටයුතු දින 200 ක ප්‍රමාදයක් සහිතව නිමකර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, විෂය පථය වෙනස්වීම්, විචලතා සහ අතිරේක කටයුතු යනාදිය හේතුවෙන් කටයුතු අවසානයේදී ඉහත මාර්ගවල පුනරුත්ථාපන කටයුතුවල ඇස්තමේන්තුගත පිරිවැය වූ එකතුව රු.මිලියන 14,816 ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 48.92 නියෝජනය වන රු.මිලියන 22,065 දක්වා වැඩි වී තිබුණි. | ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් ව්‍යාපෘති පිරිවැය ඉහළයාමට සහ ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ ලැබීමට බලපානු ඇත. | මූලික සමීක්ෂණ මත පදනම්ව මූලික ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ සාමාන්‍ය රුපසටහන් භාවිතා කිරීම වැනි හේතු කිහිපයක් නිසා මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිවල ප්‍රමාදයන්, විචල්‍යතාවයන් සහ ව්‍යාපෘති අවසන් කිරීමේ කාල දීර්ඝ කිරීම් සිදුවිය හැක. විස්තරාත්මක සැලසුමේදී සහ ඉදිකිරීම් අතරතුරදී සත්‍ය උප පස්වල තත්ත්වයට ගැලපෙන ආකාරයට සැලසුම්, ප්‍රමාණයන් සහ විෂය පථය වෙනස් කරනු ලැබේ. | ඉලක්කගත දිනයන්ට කටයුතු අවසන් කිරීමට ව්‍යාපෘතියේ විෂය පථය විධිමත්ව සැලසුම් කළ යුතුය. |